දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்:.E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல / Your No. — .....................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.
පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

මගේ අංකය / எமது இல. / My No. — ED/01/12/06/15/02

දිනය / திகதி / Date — 2008.11. 03

චක්‍රලේඛ අංක : **2008/43**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම විදුහල්පතිවරුන් වෙත

## අ. පො. ස (උසස් පෙළ) පංතිවල තෝරාගත් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම

වර්තමාන ලෝකයේ වැදගත් ප්‍රවණතාවයක් වන ගෝලීයකරණය හා සන්නිවේදන ක්ෂේත්‍රයේ සිදු වෙනස්කම් සලකා බලන විට ජාත්‍යන්තර භාෂාවක් ඉගෙනීමේ අවශ්‍යතාවය ඉතා පැහැදිලිය. ශ්‍රී ලාංකිකයිනට හුරු පුරුදු ජාත්‍යන්තර භාෂාව වන්නේ ඉංග්‍රීසි භාෂාවයි. විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනය ඇතුලු උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමට ඉංග්‍රීසි දැනුම උපකාර වනු ඇත. මේ නිසා 2001 වර්ෂයේ සිට රජයේ පාසල්වල අ. පො. ස (උසස් පෙළ) විද්‍යා විෂයයන් කිහිපයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම ආරම්භ කරන ලදී. ඊට අමතරව 2002 වර්ෂයේ සිට හය වන ශ්‍රේණියේ සිට තෝරා ගත් විෂයයන් කිහිපයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම ද ආරම්භ කරන ලදී.

02. ද්වි භාෂා අධ්‍යාපන වැඩසටහන යටතේ හය වන ශ්‍රේණියේ සිට තෝරා ගත් විෂයයන් කිහිපයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනුම ලබන සිසුන්ගේ අවශ්‍යතාවන් සලකා බලා 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යා විෂයයන්ට අමතරව තෝරා ගත් වාණිජ හා කලා විෂයයන් ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම ආරම්භ කිරීමට අධ්‍යාපන අමාත්‍යංශය විසින් තීරණය කර ඇත.

03. ඊට අදාලව, අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්ගේ "ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ. පො. ස (උසස් පෙළ) විද්‍යා විෂයයන් ඉගැන්වීම" යනුවෙන් 2001.02.23 දිනැති 2001/05 චක්‍රලේඛය හා 2002.07.30 දිනැති 2002/17 දරණ චක්‍රලේඛ අභිබවා මින් ඉදිරියට මෙම චක්‍රලේඛයේ උපදෙස් බලපැවැත් වේ.

04. මේ යටතේ 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි අ. පො.ස (උසස් පෙළ) ජීව විද්‍යා, භෞතිය විද්‍යා, වාණිජ හා කලා විෂය ධාරාවන් නියෝජනය වන සේ තෝරා ගත් විෂය දහයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට තීරණය කර ඇත .

පහත සඳහන් විෂයයන් එසේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්විය හැකිය.

- ජීව විද්‍යාව
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව
- සංයුක්ත ගණිතය

/.........02

- කෘෂි විද්‍යාව
- ගිණුම්කරණය
- ව්‍යාපාර අධ්‍යයනය
- ආර්ථික විද්‍යාව
- දේශපාලන විද්‍යාවේ මූලිකාංග
- භූගෝල විද්‍යාව

05. මෙම විෂයයන් වලට අමතරව වෙනත් විෂයයක් හෝ විෂයයන් හෝ ඉගැන්වීමට යම් පාසලකට අවශ්‍ය වන්නේ නම් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමෙන් පසු එසේ ඉගැන්විය හැකිය. එහෙත් එම විෂයය / විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් සම්පත් සැපයීමක් සිදු කරනු නොලැබේ.

06. පාසලක් ඉංග්‍රීසි මාධ්‍ය පන්තියක් ආරම්භ කිරීමේ දී ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුවේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගැනීම ශිෂ්‍යයාගේ කැමැත්ත මත පමණක් සිදුවිය යුතු අතර අ .පො. ස (උසස් පෙළ) පන්තිවලට ඇතුළත් වීම සඳහා බලපවත්වන චක්‍රලේඛයට අනුව අවශ්‍ය වන මූලික සුදුසුකම් මෙහිදීද සැපිරිය යුතුවේ.

07. උසස් පෙළ පන්තියක සිටිය හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව අදාළ චක්‍රලේඛයට අනුව ඉංග්‍රීසි මාධ්‍ය පන්ති සම්බන්ධයෙන්ද එලෙසම බල පැවැත් වේ.

08. පාසල විසින් සපයා දී ඇති විෂයය රාමුව තුළ ශිෂ්‍යයකුට තම අභිමතය පරිදි තමන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගන්නා විෂයයන් සංඛ්‍යාව තීරණය කළ හැකිය. විෂයය ධාරාව අනුව අදාළ සියලුම විෂයයන් හෝ විෂයයන් කිහිපයක් පමණක් හෝ වුවද ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගත හැකිවේ. පාසල් විසින් එසේ එක් එක් විෂයය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන සිසුන් සංඛ්‍යා පිළිබඳ විස්තර සෑම අධ්‍යාපන වර්ෂයක් ආරම්භයේදීම අධ්‍යාපන අමාත්‍යාංශයට දැන්විය යුතුවේ.

09. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන සිසුන්ට අ. පො. ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමේ දී තම අභිමතය පරිදි මාධ්‍ය තෝරා ගත හැකිය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනුම ලැබූ සියලුම විෂයයන්ට හෝ කිහිපයකට හෝ එක් විෂයයකට පමණක් හෝ වුව ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටිය හැකිය. එමෙන්ම සියලුම විෂයයන් වුවද සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් වුවද පෙනී සිටිය හැකිය. මෙසේ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය තීරණය කළ යුතු වන්නේ අ. පො. ස (උසස් පෙළ) විභාගය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදීය. පසු අවස්ථාවන්හී දී විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය වෙනස් කළ නොහැකිය. ශිෂ්‍යයා විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය එක් එක් විෂයය ඉදිරියෙන් වෙන් වෙන්ව ප්‍රතිඵල ලේඛනයේ දක්වනු ලැබේ.

එම්.එම්.එන්.ඩී. බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත්
1. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
4. විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව